සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

මගේ අංකය / எனது இல / My No: DDD/HO/SW/15/08/ සමි II
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2017.05.25

සියළුම සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්.
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණය මත සමෘද්ධි සහනාධාරලාභීන් තෝරා ගැනීම</u>

අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගෙන දිප ව්‍යාප්තව සිදු කරන ලද සමීක්ෂණයෙන් අනතුරුව එම සමීක්ෂණ පත්‍රිකා පරිගණකගත කර ඇත. එම පරිගණකගත කරන ලද තොරතුරු ආශ්‍රයෙන් ප්‍රධාන නිර්ණායක 06 ක් සහ අනු නිර්ණායක 29 ක් පදනම් කරගෙන පරිගණක මෘදුකාංගයක් ආශ්‍රයෙන් සහනාධාර ඉල්ලුම්කරු ඇගයීමකට ලක් කරනු ලැබේ.

02. මුල් අදියරේදී මෙසේ ඇගයීමකට ලක් කරන ලේඛණය ලකුණුද සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දෙන අතර, ඉන් පසුව මෙම පරිගණක මෘදුකාංගය භාවිතයෙන් සහනාධාරලාභීන් තෝරාගැනීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරනු ලැබේ.

03. ඔබ වෙත ලබා දෙනු ලබන ලේඛණයේ වැඩිම ලකුණු දිළිඳු බව වැඩිකමේ සිට අවරෝහණ ක්‍රමයට ඇති අතර, දැනට ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වෙන් කර ඇති සහනාධාර ප්‍රමාණය හා සහනාධාර වටිනාකම් අනුව දැනට ලබා දෙනු ලබන ප්‍රමාණයන් පදනම් කර ගෙන නව ලේඛණය යටතේ සහනාධාර නිකුත් කල යුතු වේ. තවද, මේ වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට සහනාධාර සඳහා වෙන් කර ඇති මුදල් සීමාව කිසිම හේතුවක් නිසා වැඩි නොකරන බව දන්වා සිටිමි.

04. පරිගණකය ආශ්‍රයෙන් ලබා දෙනු ලබන නාම ලේඛණය සහනාධාරලාභියා තේරීමට යොදා ගන්නා බැවින් පරිගණකයට දත්ත ඇතුලත් කිරීමේදී හෝ යම් අවස්ථාවක සිදු වී ඇති අඩුපාඩුවක් මත ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීම හා ඉදිරිපත් වන අභියාචනා සලකා බැලීම සිදුල යුතුය. මේ සඳහා මාගේ සමාංක හා 2017.05.23 දිනැති ලිපිය මගින්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සමෘද්ධි සහනාධාර පවුල් තෝරාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත්කරන ලෙස දන්වා ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramull

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail- dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
Hot Line : 0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
Hot Line: 011- 2887722

05. සහනාධාරයේ වටිනාකම අනුව, දැනට ලබාගන්නා පවුල් සංඛ්‍යාවෙන් 15% ක සංචිතයක් ඉතිරිකර පළමු තෝරාගැනීමේදී සහනාධාරලාභීන් තෝරාගත යුතු වේ. ඉතිරි කර ගත් 15% ක සහනාධාර ප්‍රමාණය අභියාචනා සඳහා තබාගත යුතුය. ඉහත උපදෙස් පරිදි, මුලින් තෝරා ගන්නා සහනාධාරලාභී නාමලේඛණය ග්‍රාමනිළධාරී වසම් මට්ටමින් සකස් කර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හා සමෘද්ධි සංවර්ධන නිළධාරී කාර්යාලයේ නාම පුවරුවේ ප්‍රදර්ශණය කල යුතු වේ. **මෙය ප්‍රදර්ශණය කර දින 14 ක් ඇතුලත අභියාචනා සඳහා කාලය ලබා දී,** එම අභියාචනාද සැලකිල්ලට ගෙන අවසන් සහනාධාර වාර්තාව සකස් කල යුතු වේ.

06. ඉහත කාරණය පහත සඳහන් උදාහරණය මගින් පැහැදිලි කර ඇත.

ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උපරිමය පවුල් 1500 ක් ලෙස සිතමු.

| අ.අ. | සහනාධාර වටිනාකම | පවුල් සංඛ්‍යාව | සංචිතය (අභියාචනා සඳහා) 15% | පළමු තෝරාගැනීම |
|---|---|---|---|---|
| 01 | 3,500/- | 600 | 90 | 510 |
| 02 | 2,500/- | 450 | 68 | 382 |
| 03 | 1,500/- | 400 | 60 | 340 |
| 04 | 420/- | 50 | 08 | 42 |
| එකතුව | | **1,500** | **226** | **1,274** |

ඉහත උදාහරණය විශ්ලේෂණයේදී, පරිගණක මෘදුකාංගය මගින් ලබා දෙනු ලබන නාම ලේඛණයේ වැඩිම ලකුණු ඇති පවුල් 510 ක් සඳහා රු. 3,500/- සහනාධාර වටිනාකමද ඊලඟ පවුල් 382 සඳහා රු. 2,500/- සහනාධාර වටිනාකමද ඊලඟ පවුල් 340 සඳහා 1,500/- සහනාධාර වටිනාකමද ඊලඟ පවුල් 42 සඳහා රු. 420/- සහනාධාර වටිනාකමද යටතේද නාම ලේඛණය පිළිවෙලට ලබා දිය යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**නීල් බණ්ඩාර හපුහින්න**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්:-

01. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස

02. ගරු සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කා.දැ.ගැ.ස